# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# සංගීතය

# 9 ශ්‍රේණිය



### අධ්‍යාපන සංවර්ධන අංශය

### කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී. ඉරෝෂිනී කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**

කේ. ඩී. ප්‍රියන්ත - ගුරු උපදේශක

කේ. ආර්. දිල්රුක්ෂි- ගුරු සේවය

**සියලු හිමිකම් ඇවිරිණි**

**පෙරදිග සංගීතය**

III වන වාරය

කෙටි සටහන් 9 ශ්‍රේණිය

## කාෆි රාගය

ආරෝහණ ඃ- ස රි ග ම ප ධ නි ස̇

අවරෝහණඃ- ස̇ නි ධ ප ම ග රි ස

(1) ස රිග සරි ප

(2) සස රිරි ගග මම ප

(3) රිග රිම ගරි ස -

### කාෆි රාගයේ ස්වර අභ්‍යාස

රි ග රි ස

රි ග ම ග රි ස

රි ග ම ප ම ග රි ස

රි ග ම ප ධ ප ම ග රි ස

රි ග ම ප ධ නි ධ ප ම ග රි ස

රි ග ම ප ධ නි ස̇ නි ධ ප ම ග රි ස

### රාගය කාෆි සර්ගම් ගීතය
### (ත්‍රිතාල් මධ්‍යලය)

ස්ථායි

වන්නම්

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | - | - | ම | ප | ධ | නි | ස̇ |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |

අන්තරා

| 0 | | | | 3 | | | | × | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ම | ම | ප | ධ | නි | නි | ස̇ | - | රි̇ | ග̇ | රි̇ | ස̇ | නි | ධ | නි | - |
| ධ | ධ | ප | ප | ප | ධ | ප | ම | ප | - | - | ම | ප | ධ | නි | ස̇ |
| නි | ධ | ප | ම | ග | ග | රි | රි | රි | ප | ම | ප | ම | ග | රි | ස |

### රාගය කාෆි සර්ගම් ගීත
### තාලය (ඣප්තාල් මධ්‍ය)

ස්ථායි

| 0 | | | 3 | | | × | | | 2 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නි | ධ | ම | ප | ග | රි | ස | රි | ග | ම | ප | - |
| ප | ධ | ම | ප | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |

අන්තරා

| 0 | | | 3 | | | × | | | 2 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ධ | ම | ප | ධ | නි | ස̇ | රි̇ | ග̇ | රි̇ | ස̇ | - |
| ධ | නි | ස̇ | රි̇ | ග̇ | රි̇ | ස̇ | රි̇ | නි | ධ | - | ප |
| ප | ධ | ම | ප | ස̇ | නි | ධ | ප | ම | ප | ග | රි |
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | ධ | ම | ප |

(1)

රාගය - කාෆි - මධ්‍යලය ගීතය

තාලය ත්‍රිතාල්

| | × | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථායි | | | | | | | ස | නි | ස | රි | රි | ග | - | ම | - | ම |
| | | | | | | | ස | ඳ | රැ | ස් | ග | ලා | s | යේ | s | බො |
| | ප | - | ප | - | - | - | ස | නි | ස | රි | රි | ග | - | ම | - | ම |
| | හෝ | s | සේ | s | s | s | ස | ඳ | රැ | ස් | ග | ලා | s | සේ | s | බො |
| | ප | - | ප | ම | ප | ධ | නි | සං | නි | ධප | ම | ප | ග | - | රි | - |
| | හෝ | s | සෙ | සු | ව | ඳ | ගෙ | න | සු | ළං | ග | හ | මා | s | යේ | s |
| | රි | නි | ධ | නි | ප | ධ | ම | ප | ග | ම | ප | ග | ම | ම | ස | නි |
| | තු | රු | මු | දු | න | ත | සි | ඹ | හ | ඬ | න | ගා | s | ල | සි | ත |
| | ස | ග | රි | ම | ග | රි | ස | නි | ස | රි | රි | ග | - | ම | - | ම |
| | තො | ස | ප | තු | රා | s | ස | ඳ | රැ | ස | ග | ලා | s | යේ | s | s |

| | × | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අන්තරා | ම | ම | ම | ප | නි | නි | ස | - | රි | රිගු | රි | සං | රි | නි | සං | - |
| | තු | ඩෙ | හි | තු | ඬ | ත | බා | s | කෝ | s | කි | ල | ය | න් | ගේ | s |
| | ප | රි | සං | රි | නි | නි | සං | සං | ප | ධ | ප | නි | ධ | ප | ස | නි |
| | පෙ | ම් | ලො | වේ | s | ර | ග | න | ර | ග | න | ර | ම | මු | ස | කි |
| | ස | ග | රි | ම | ග | රි | ස | නි | | | | | | | | |
| | නැ | ත | සැ | ප | වෙ | නැ | ස | ද | | | | | | | | |

බ්‍යාල ගීත - ආනන්ද ජයසිංහ

වන්නම්

- වන්නම් යන්නෙහි අර්ථය වර්ණනාව යන්න යි.
- දෙවියන්, සතුන්, වෙනත් වස්තූන් පිළිබඳ වර්ණනාව වන්නම්වල අයත් ය.
- උඩරට, පහතරට, සබරගමු නර්තනයන්ගේ භාවිතාකරනු ලබන ගායනය, නර්තනය හා වාදනය ඇතුලත් සුවිශේෂ අංගයක් ලෙස වන්නම් හැඳින්විය හැකි ය.

උඩරට වන්නම්

- මහනුවර යුගයේ ආරම්භ වී ඇත.
- සතර කෝරලය, සත් කෝරලය, බදුල්ල, උඩුනුවර. යටි නුවර, හේවා හැට, ගලගෙදර, හඟුරන්කෙත ආදී ප්‍රදේශයන් හි ප්‍රචලිත ය.
- කර්ණාටක සංගීතයෙන් පෝෂණය වී ඇත.
- ගනිතාලංකාර නම් සංගීතඥයකු තනු නිර්මාණයකර ඇත.
- සේ ගී ගණයට අයත් වේ.
- තානමට අනුව ගීතය ගායනා කිරීම වන්නම්වල විශේෂ ලක්ෂණයකි.
- සිංහල හා ද්‍රවිඩ වචන භාවිතා වේ.
- ගැටබෙරය හා තාලම්පට භාවිතා කරනු ලැබේ.
- උඩරට වන්නම තානම, කවිය, කස්තිරම, සීරුමාරුව අඩව්ව ආදී කොටස් පහකින් යුක්ත ය.
- වන්නම් 32 කි.

## පහතරට වන්නම්

- දකුණු පලාතේ ගාල්ල, මාතර, අම්බලන්ගොඩ, බෙන්තර ආදී ප්‍රදේශවල ප්‍රචලිත ය.
- දඹදෙනිය යුගයේ ආරම්භ වී ඇත.
- කලි කාල සර්වඥ පණ්ඩිත ෂෂ වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ ආරම්භ වී ඇත.
- විශ්නු දෙවියන් උදෙසා රචනාකර ඇත.
- බෙරපදය, තානම, කවිය, ඉරට්ටිය වශයෙන් පහතරට වන්නම් කොටස් හතරකින් සමන්විත ය.
- ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරය වේ.

## සබරගමු වන්නම්

- රත්නපුරය, කලවාන, කුකුළු කෝරලය, කුරුවිට, නිවිතිගල ආදී ප්‍රදේශවල ප්‍රචලිත ය.
- කලවානේ ධර්මාලංකාර අතපත්තු මුලදි වන්නම් 18ක් සංස්කරණය කර ලියා ඇත.
- ගාමිකව වන්නම් 24ක් ඇතත් 18ක් භාවිතයේ ඇත.
- ගාහක, අනිලා, කෝකිල, වන්නම් කිහිපයකි.
- ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුල වේ.
- සබරගමු වන්නම් දවුල් පදය, තානම, කවිය, කලාසම, සහ අඩව්ව වශයෙන් කොටස් පහකි.

## හටන් ගී

- හටන් ගී මහනුවර යුගයේ ප්‍රචලිත වී ඇත.
- හටන් වලදී රජතුමාගේ පරිශ්‍රමය, ජයග්‍රහණ, වර්ණනා කරමින් නිර්මාණය වූ ගී හටන් ගී නමින් හැඳින් වේ.
- හටන් කාව්‍ය ග්‍රන්ථ තුනකි. කුන්ස්තන්තීනු හටන, ලන්දේසී හටන සහ මහා හටන වශයෙනි.
- සේ ගී ගණයට අයත් වේ.
- සරල සහ සංකීර්ණ බස ඇතුලත් ය.

නොමදින් විකුම් පාලා
සැදෙමින් යුදට ජය ලන්දෙසින් සමගින් එ ජනරාලා
සමිඳුන්ගේ භවිපාලා
සියසේ අතින් මියෙමින් ගියෝ යුදයෙන් ඇනුම් කාලා

පන්නා එ ලන්දේසි
පන්නා මෙසෙල පෙන්නා බලය පන්නාලීය සී සී
ගෙන්නාල ඉංග්‍රීසි
දන්නා ඔවුන් ගෙන්නා බැඳල සෙන්නා අයට දාසි

දුරලා සතුරු වියවුල්
කරලා දිගඹු බබලා වැජඹි නිමලා එකින් එක දුල්
ලකලා මෙ අප මිහිපල්
සකලා සිරිත් විකලලා නොකර මැඩලලා නැසී වියවුල්

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| + | + | නි | ස | රි | - | - | ගු | ම | රි | ගු | රි | ස | - | - | - |
| + | + | නො | ම | දි | න් | s | වි | කු | ම් | පා | s | ලා | s | s | s |
| + | + | ග | ම | ප | - | - | ප | ප | - | ධ | ප | ම | ධ | ප | ම |
| + | + | සැ | දෙ | මි | න් | s | යු | ධ | ට | ජ | ය | ල | න් | s | දෙ |
| ගු | රි | ස | නි | රි | - | - | ගු | ම | රි | ගු | රි | ස | - | - | - |
| සි | න් | ස | ම | ගි | න් | s | එ | ජ | න | රා | s | ලා | s | s | s |
| + | + | ගු | ම | ප | - | - | ප | ප | - | ය | ස | ප | ධ | ප | ම |
| + | + | සැ | දෙ | මි | න් | s | යු | ධ | ට | ජ | ය | ල | න් | s | දෙ |
| ගු | රි | ස | නි | රි | - | - | ගු | ම | රි | ගු | රි | ස | - | - | - |
| - | - | | | | | | | | | | | | | | |
| s | s | | | | | | | | | | | | | | |

## උකුසා වන්නම

උඩරට නර්තන සම්ප්‍රදායේ එක වන්නමි. උකුස්සාගේ චර්යා රටාවන් මෙම වන්නමේ විස්තර වේ. මහ තනි තිතට ගායනය කෙරේ. ගැටබෙරය තාල වාදනය සඳහා යොදා ගනී.

### මහ තනි තිත

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| ස | - | ප | - | - | - | ධ | ප | ම | ධ | ප | ම | ගු | රි | ස | නි |
| නා | s | නා | s | s | s | s | s | s | s | s | s | s | s | s | s |
| ස | රි | ගු | ම | ගු | රි | ගු | රි | ස | - | - | - | - | - | - | - |
| ත | s | තෙ | s | න | න | ත | s | නම් | s | s | s | s | s | s | s |
| ස | - | ප | ප | ප | ප | ධ | ම | ම | ධ | ප | ම | ගු | රි | ස | - |
| තා | s | න | ත් | ත | තෙ | න | ත් | ත | ම | දෙ | න | තා | s | නා | s |
| ස | - | ප | ප | ප | ප | ධ | ම | ම | ධ | ප | ම | ග | රි | ස | - |
| තා | s | න | ත් | ත | තෙ | න | ත් | ත | ම | දෙ | න | තා | s | නා | s |
| ස | - | ප | - | - | - | ධ | ප | ම | ධ | ප | ම | ගු | රි | ස | නි |
| තා | s | නා | s | s | s | s | s | s | s | s | s | s | s | s | s |
| ස | රි | ගු | ම | ගු | රි | ගු | රි | ස | - | - | - | - | - | - | - |
| ත | s | තෙ | s | න | s | ත | s | නම් | s | s | s | s | s | s | s |

### තානමේ නාද මාලාවට කවි ගායනා කෙරේ

මෝරා බීජයෙනා //
තලපත් දෙකඩත් කර සිත් තුටු වෙත් //
දෙන්නා අදර තොසා

නැරා තටුපතිනා //
ලෙලවත් සොලවත් පියඹත් නද දෙත් //
යන්නා පවන රැසා

සාරා බොජුනයෙනා //
අයිරන් පෙතියන් තුඩ ගත් බුදි සිත් //
පැන්නා එජල රැසා

බේරා ඉසිහු දනා //
පවසත් මෙපවත් දූන සත් ලොවටත් //
වන්නා නම් උකුසා

## ප්‍රශස්ති

- කෝට්ටේ යුගයෙන් ආරම්භ වී මහනුවර යුගයේ දී ප්‍රචලිත වී ඇත.
- රජවරුන්ගේ හා ප්‍රභූවරුන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා ගායනා කර ඇත.
- අතිශෝක්තියෙන් වර්ණනා කර ඇත.
- කර්ණාටක සංගීතයේ ආභාසය ලබා ඇත.
- මෙම ගීතවල ද්‍රවිඩ, මලයාල, තෙළිඟු, සිංහල භාෂා මිශ්‍රණයකින් නිර්මාණය වී ඇත.
- කවිකාර මඩුව තුළදී ප්‍රශස්ති ගායනාකර ඇත.
- ගණිතාලංකාර නම් සංගීතඥයා ප්‍රශස්ති ගී රාශියක් නිර්මාණය කර ඇත.
- ගායනය, වාදනය, නර්තනය, ප්‍රශස්ති ගී සඳහා යොදාගනී.
- ප්‍රශස්ති ගැයුවන් "වන්දිභට්ටයන්" ලෙස හැඳින්වේ.
- පැරකුම්බා සිරිත, ශ්‍රී නාමය, නරේන්ද්‍රසිංහ වර්ණනාව ප්‍රශස්ති ගීත ඇතුලත් ග්‍රන්ථ වේ.
- උඩැක්කිය, පන්තේරු, ගැටබෙර, තම්මැට්ටම්, රබන් ආදී දේශිය භාණ්ඩ යොදාගෙන ඇත.
- මුදුප්පදය හා අනුගැයියකින් යුතු ව ප්‍රශස්ති කාව්‍ය බහුලව නිර්මාණය වී ඇත.

ලක්ෂමී බුජවාසා
සසතු ජය

වීර විජය ලෂමී ශිවකාමී
නැර බාහු ශිඛරය විසු ප්‍රේමී
සාර වතිත ගරු වඩනැති සෝමී
වීර නරේන්ද්‍ර සිංහ ස්වාමි

සත්‍ය වචන හරිස්චන්ද්‍ර ව තාරා
නිත්‍ය ලෝක සංගීත සුභෝජා
මත්ත ධීර හරි හත වර තේජා
පෘථිවි පාල කුල බන්ධු සරෝජා

සෘංගාධර ශුර නිවසේ මුහුදා
තුංගා කර දිග සුවිබෝධා
සෘංගාතේ නව නාට්‍ය විනෝදා
ලංකාපති වර රාජ වරෝජා

මන්දුයි ප්‍රතිකාල් ද්‍රවිඩ ලන්දේසි
බන් එජටා ලාඩය සන්නාසී
නන් දෙසවල මේ භාෂා විශේෂී
පින්වත් අප හිමි දූන නෙක විලසී

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | | / | | | | / | | | | / | | | |
| ස | ප | ප | - | - | - | ධ | ප | ම | ධ | ප | ම | ග | රි | ස | නි |
| ල | ක්ෂ් | මි | s | s | s | s | s | s | s | s | s | s | s | s | s |
| + | + | රි | ග | ම | රි | ග | රි | ස | - | - | - | - | - | ප | ධ |
| + | + | බු | ජ | වා | s | s | s | සා | s | s | s | s | s | ස | s |
| ම | ධ | ප | ම | ග | රි | රි | - | | | | | | | | |
| තු | s | කු | s | ජ | s | ය | s | | | | | | | | |
| ප | සං | සං | සං | සං | - | සං | සං | ධ | සං | නි | ධ | ප | ම | ග | රි |
| වි | s | ර | වි | ජ | ය | ල | ක්ෂ | මී | s | ශි | ව | කා | s | මි | s |
| + | රි | රි | රි | රි | ග | ම | ග | රි | ග | ම | ග | රි | ස | ස | - |
| + | නැ | ර | බා | s | හු | ශි | ක | ර | ය | වි | සු | ප්‍රේ | s | මී | s |
| + | නි | ධ | නි | ස | ස | රි | - | රි | ග | ම | ග | රි | ස | ස | රි |
| + | සා | ර | ව | ති | ත | ග | රු | ව | ව | නැ | ති | සෝ | s | මි | s |
| + | ප- | ප | ම | ග | -ග | රි | රි | රි | ග | ම | ග | රි | ස | ස | - |
| + | විs | ර | න | රේ | sන් | ද්‍රා | s | සි | ං | හ | s | ස්වා | s | මි | s |

| අදාල ශීර්ෂ | වන්නම් | ප්‍රශස්ති | හටන් |
| --- | --- | --- | --- |
| ගීත වර්ගය සඳහා නිර්වචනයක් | | | |
| ආරම්භය හා ව්‍යාප්තිය | | | |
| සංගීතඥයන්ගේ දායකත්වය | | | |
| ගීත ගායනා කළ ස්ථානය | | | |
| දායක වූ සංගීත ආභාසය | | | |
| භාවිතාකළ සංගීත භාණ්ඩ | | | |
| නිර්මාණය වූ ග්‍රන්ථ | | | |
| ගීත වර්ගවල සුවිශේෂ ලක්ෂණ | 1.<br>2.<br>3.<br>4.<br>5. | | |

## ජන ගී තනු ආශ්‍රිත සරල ගී

මල්සරා බැල්ම හෙලා

මල්සරා බැල්ම හෙළා මගේ සිතට කොඳුරනවා
රන්මලී දක්ක ගමන් මල් වාරම් කියවෙනවා
හිත බැන් සෙනේ මම් පවසන්නෙම් ද කොයි ලෙසින්
රන්මලී ...........

තිස්සෙ ම ගම සුවඳ කරන් පිපුණා කිණිහිරිය මලී
විස්තර දුටුව ද බඹරුනි පිපිලා දොඹ මුතු කැකුළී
ලස්සන හුරු බුහුටිකමට දිලෙනා ඝීතින් ළකලී
ඉස්සර කළ පිනට මගේ පිපුණා බල ළඳ කොමළී






ලස්සන ගුණ කනක බරණ සවන් පැලඳි පුල්ලි මලී
ඇස් නිලුපුල් පෙති ගෝමර ගෙල වට දිලි රුවන් මලී
කොස් උයනේ මගේ පැලලට එළිය දෙන්ට පිපුණ මලී
වැස්ස ළඟයි බන් මාසේ මා සනසාපන් කොමළී

පද රචනය, තනු නිර්මාණය සහ ගායනය
රෝහණ බැද්දගේ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ස් ගු ස් | නිස්නි | ධ - - | - මම | ස් - ස් | නිස්නි | ධ - - | - පම |
| ග - ග | ම - ම | ප - ප | පමප | ධ - ප | ධපම | ම - ධ | පමග |
| ස්ථායි කොටස | | | | | | | |
| ග - ම | ප - - | ප - ප | ධපධ | ම - ම | පධප | ම - ම | පමග |
| මල්ස | රා s s | බැල්ම | හෙලාs | මගේs | සිතට | කොඳුර | නවාs |
| ග - ම | ප - - | ප - ප | ධපධ | ම - ම | ධපම | මමම | මම - |
| රන්ම | ලී s s | දූක්ක | ගමන් | මල්වා | sරම් | කියවෙ | නවාs |
| - - - | - - - | - - - | - ස්ස් | ස් - ස් | නිධනි | ප - ප | ධ - නි |
| | | | sසිත | බැන්ද | සෙනේs | මම්ප | වසන් |
| ස් - නි | ධනිප | ධ - - | - - - | ග - ම | ප - ධ | - - - | - - - |
| නෙම්ද | කොයිලෙ | සින්s | s s s | රන්ම | ලී s s | | |
| අතුරු වාදනය | | | | | | | |
| ධපම | -ධප | ම - ධ | පම- | ග - ම | ප - - | - - - | - - - |
| නිධප | -නිධ | ප - නි | ධප - | ධ - ප | ම - - | - - - | - - - |
| අන්තරා කොටස | | | | | | | |
| නි - නි | නිධප | පපධ | නිධප | මමප | නිධප | ම - ම | මප - |
| තිස්සෙ | මගම | සුවඳ | කරන | පිපුනා | sකිණි | හිරිය | මලීs |
| ග - ග | ගගම | ප - ප | නිධප | පධනි | -ධප | ධපම | මම - |
| විස්ත | රඳුටු | වදඹ | ඹරුනි | පිපිලා | sදොඹ | මුතුකැ | කුලීs |
| පධනි | -ධප | ධ - ප | මම - | ධ - ධ | ධධනි | ස් - ස් | ස්රිස් |
| | | | | ලස්ස | නහුරු | බුහුටි | කමට |
| ස් - ස් | - රි - | ස් - ස් | රිස්නි | ධ - ධ | ධනි - | ස් - ස් | ස්රිස් |
| දිලෙනා | s දැ s | සනීල | කලීs | ඉස්ස | රකල | පිනට | මගේs |
| නි - නි | ස්රිස් | නි - නි | නිනි - | ග - ග | ගග - | ම - ම | පනී - |
| පිපුනා | sබල | ළඳකො | මලීs | ඉස්ස | රකල | පිනට | මගේs |
| ධධප | ධපම | ම - ධ | පමග | | | | |
| පිපුනා | sබල | ළඳකො | මලීs | | | | |

<u>පංචතූර්ය වාදනය</u>

පංචතූර්ය වාදනය අනුරාධපුර යුගයේ සිට ශ්‍රී ලංකාවේ පැවත එන විශේෂ වාදන අංගයකි. දුටුගැමුණු රජතුමාගේ බලකායේ විශාල පිරිසක් විසින් පංචතූර්ය වාදනය කරනලද බව සඳහන් වේ. ආතත, විතත, විතතාතත, ඝන, ශුෂිර යනුවෙන් වාදනය කිරීමේ ආකාරය අනුව වර්ග 5ක් පංචතූර්ය වාදනයට අයත් ය. ආතත යනු අතින් වයන භාණ්ඩයි. විතත යනු කඩිප්පුවකින් නැතහොත් කෝටුවකින් වයන භාණ්ඩ යි. විතතාතය යනු අත සහ කෝටුව යන දෙක ම යොදාගෙන වයනු ලබන භාණ්ඩ යි. ඝන භාණ්ඩ යනු ලී ලෝහ වැනි ඝන ද්‍රව්‍යවලින් සැකසුණු තැළීමෙන් හඬ උපදවන භාණ්ඩ යි. ශුෂිර වාද්‍ය භාණ්ඩ යනු පිඹීමෙන් වයන භාණ්ඩ යි. එක් එක් කොටසට අයත් භාණ්ඩ නම් වට්ටෝරුවක් පහත දැක්වේ.

| භාණ්ඩ වර්ගය | භාණ්ඩවල නම් |
|---|---|
| ආතත | ගැටබෙරය, පහතරට බෙරය, උඩැක්කිය, රබාන       |
| විතත | තම්මැට්ටම     |
| විතතාතත | දවුල   |
| ඝන | දඬුබෙර, තාලම්පොට, තලිය (සිම්බල්) පන්තේරු, ගෙජ්ජි, රහු     |
| ශුෂිර | හක්ගෙඩි, කොම්බු         |